


# ක්‍රිස්තුස් වහන්සේ තුළ සම්පූර්ණ කම

## ෆෆ් දුප්ලේසිස්

34 වන වියේ පසුවන ෆෆ් දුප්ලේසිස් , දකුණු අප්‍රිකානු කණ්ඩායමේ අඛණ්ඩව පෙරමුණේ සිට ඇති දකුණු අත් පිතිකරුවෙකි. කණ්ඩායමේ වර්තමාන නායකත්වය දරණ ඔහු 2012 නොවැම්බර් මාසයේ ආරම්භ කරන ටෙස්ට් ක්‍රිකට් දිවිය තුළ පළමු තරගවලියේදීම ශතකයක් වාර්තා කළ සිව්වන දකුණු අප්‍රිකානු ක්‍රීඩකයා බවට පත්විය.

අවුරුදු හතක සාර්ථක ගමනක් හා බොහෝ රටවල ක්‍රීඩා අත්දැකීම් සහිත දුප්ලේසිස් තම විශ්වාසය හා වටිනාකම ලබා ගන්නේ කොතැනින්දැයි අමතක නොකර ඇත.



ෆෆ් දුප්ලේසිස්,
දකුණු අප්‍රිකාව

පාසල් කාලයේ බොහෝ ක්‍රීඩා කලත් ක්‍රිකට් මගේ ප්‍රියතම ක්‍රීඩාව වුණා. ජාත්‍යන්තර මට්ටමින් ක්‍රීඩා කරන්න පටන් ගද්දීම, ඒ තලයේ වෙනත් ඕනෑම ක්‍රීඩාවක වගේම, හොඳ කාලයන් හා නරක කාලයන් කියන දෙකටම මුහුණ දෙන්න වෙනවා කියන එක ඉගෙන ගත්තා. අත්දැකීම් වැඩි වෙන්න වැඩි වෙන්න ක්‍රීඩාවේ විතරක් නොවේ ජීවිතයේත් - හොඳ හා නරක කියන කාල දෙකේම අඛණ්ඩව ඉන්න පුරුදු වුණා. මම පුද්ගලික සාර්ථකත්වයයි අසාර්ථකත්වයයි සලකන්නෙත් ඒ විදියටමය. ඒවා තවත් වර්ධනය වෙන්න අවස්ථාවන් කියලා සලකනවා.

මම හැදී වැඩුණේ මම ක්‍රිස්තුස් වහන්සේගේ අනුගාමිකයෙක් කියලා හිතාගෙන හැබැයි මට ඒක ආගමක් වුණා විතරයි. යේසුස් වහන්සේ එක්ක මට සම්බන්ධකමක් තිබුණේ නැති නිසා කිසි දෙයක් මගේ හිතේ මුල් ඇදලා තිබුණේ නැහැ. දැන් මගේ හොඳ යාළුවෙක් වන පාස්ටර් කෙනෙක් තමයි යේසුස් වහන්සේගේ ප්‍රේමය සැබැවින්ම කොයි වගේද කියලා මට පෙන්නුවේ. මේ බලවත් සත්‍යතාවය මට වැටහුණාම මම බෞතිස්ම වෙන්න තීරණය කළා. ක්‍රිස්තුස් වහන්සේට මගේ ජීවිතය භාරදුන් මොහොතේ මගේ ජීවිතය ක්ෂණිකව වෙනස් වුණා.

දෙවියන් වහන්සේගේ සැබෑව පැහැදිලිව තේරුම් ගෙන ක්‍රිස්තුස් වහන්සේ තුල සම්පූර්ණ කමක් මට ලැබුණා. මේ සත්‍යතාවයේ විදියට මගේ ජීවිතය වෙනස් කරන්න මම පටන් ගත්තා.

දෙවියන් වහන්සේගේ දෑතට මගේ ක්‍රිකට් ජීවිතය භාර කරලා, ජීටිය තුල වෙන ජය පරාජය සියල්ල උන්වහන්සේගේ කැමැත්ත කියලා විශ්වාස කරන්න මට මුලදි ටිකක් අමාරු වුණා. නමුත් දැන් ඇදහිල්ලෙන් වගේම දෙවියන් වහන්සේගේ සර්ව බලය ගැන දැනුමෙන් වර්ධනය වෙලා ඉන්න නිසා උන්වහන්සේ මාව මෙතන තියලා තියෙන්නේ යම් පරමාර්ථයකට කියලා තද විශ්වාසයක් තියෙනවා. මට උන්වහන්සේ තුල පරමාර්ථයක් තියෙනවා.

මේ ක්‍රීඩාව තුල ක්‍රිස්තු අනුගාමිකයෙකු හැටියට මට අභියෝග කීපයක් තියෙනවා. පළවෙනියටම මම ඉන්න වටපිටාව. විවිධ ක්‍රීඩකයන් එන්නේ විවිධ විශ්වාස තුලින්. හුගක් වෙලාවට කණ්ඩායමේ එකම ක්‍රිස්තු අනුගාමිකයා මම. එතැනදි තනිකම දැනෙනවා. මට ශක්තිය දෙන්න, එකට යාච්ඤා කරන්න කවුරුවත් නැහැ. දෙවනි දේ තමයි අපි ගොඩක් සංචාර කරන නිසා මුහුණ දෙන පරීක්ෂාවන්. හුගක් වෙලාවට නොකල යුතු දේවල් කරන්න යාළුවන්ගෙන් ලොකු පීඩනයක් දැනෙනවා. නමුත් මම ඇදහිල්ලේ වර්ධනය වෙනකොට පරිනත වෙන කොට, ඒවාට නැහැ කියන්න ලේසියි.

මේ ක්‍රීඩාව තුල මගේ සාර්ථකත්වයට හේතුව යේසුස් වහන්සේ කියලා මම දන්නවා. ඒ ගැන මම දිනපතා ස්තුති කරනවා. මගේ ක්‍රිකට් දිවිය අවසානයේ ක්‍රීඩකයන්ට උපරිමය කරන්න අභියෝගයක් දුන්න ඉතා හොඳ නායකයෙක් විදියට මාව මතකයේ රැඳෙනවාට තමයි කැමති. ඒ වගේම මගේ විශ්වාසයන් මත භය නැතුව හිටගන්න කෙනෙක් හැටියට අන් අය දකින්න ඕනෙ.

අවසාන ලෙස මගේ රටට හොඳ බලපෑමක් ඇති කරන්න මට ඕනේ. මගේ ජීවිතයට ක්‍රිකට් පිටියේ රැස්කරන ලකුණු වලට වඩා ලොකු පරමාර්ථයක් තියෙනවා කියලා මම දන්නවා. මිනිස්සු එක්ක කාලය ගත කරලා යේසුස් වහන්සේගේ ප්‍රේමය ඒ අයටත් පෙන්නුම් කරන්න වගේම ඒ අය තුලින් ඒ ප්‍රේමය බබලනවා දකින්න මම බලාපොරොත්තු වෙනවා.

<u>ෆෆ්ගේ ප්‍රියතම බයිබල් පදය</u>

**“නුඹලා කිසිවක් ගැන කණගාටු නොසිතා සියල්ලේදි ස්තුති දීම සමග යාච්ඤාවෙන්ද, කන්නලව්වෙන්ද, නුඹලාගේ සියලු ඉල්ලීම් දෙවියන් වහන්සේට දන්වන්න.”**

**- පිලිප්පි 4:6**

